Energizer®




# ENERGY E10


Energizer
1
2
1
3
4
5

1.1


12:03
2015-01-01 Thu
Simple Mobile
AT&T
Energizer
Menu
Names

1.2




2.1




2.2




2.3



3.1



3.2

## ඔබගේ ජංගම දුරකථනය හඳුන්වාදීම

ඔබගේ ජංගම දුරකථනයේ පිරිසැලැස්ම, යතුරු, සංදර්ශකය සහ අයිකන හඳුනා ගන්න.

---

**යතුරු**

පහත වගුව ඔබට දුරකථනයේ යතුරු පිළිබඳ කෙටි විස්තරයක් සපයයි:

| අයතමය | යතුර | කාර්යය |
|---|---|---|
| **1** | **කාර්යය** | තිරයේ පහතින් දැක්වෙන ක්‍රියාව සිදු කරයි. |
| **2** | **මං සෙවුම** | දුරකථනය සූදානම් අවස්ථාවේදී පරිශීලක නිර්වචනාත්මක කාර්යයන් වෙත ප්‍රවේශ වීමටද මෙනු අවස්ථාවේදී, මෙනු විකල්ප වෙත අනුචලනය වීමටද හැකිය. |
| **3** | **ඇමතුම්** | ආසන්න කාලයේ ගත් සහ ලද ඇමතුම් ලැයිස්තුව පෙන්වීම හෝ දිස්වූ දුරකථන අංකයට ඇමතුමක් ලබා ගැනීම. ඔබට එන ඇමතුමකට පිළිතුරු දීම කළ හැකිය. |
| **4** | **විසන්ධි කිරීම** | ඇමතුමක් අවසන් කිරීම හෝ එන ඇමතුමක් ප්‍රතික්ෂේප කිරීම. දුරකථනය ක්‍රියාත්මක කිරීම / ක්‍රියා විරහිත කිරීම සඳහා තත්පර 3ක් ඔබාගෙන සිටින්න. |
| **5** | **1……0** | අංක, පාඨ සහ / හෝ විශේෂිත අනුලක්ෂණ ඇතුළත් කරන්න. |

## තිරය

ඔබගේ ජංගම දුරකථනයේ තිරය පහත පරිදි සැලසුම් කර ඇත:

(1.2 බලන්න –2 පිටුව)

## අයිකන

දුරකථනයේ විවිධ අංගවල ක්‍රියාකාරී මට්ටම පෙන්නුම් කරමින් තිරයේ ඉහළ දිස්වන අයිකන පිළිබඳව දැන ගන්න:

| අයිකනය | පෙන්නුම් කරන කාර්යය |
|---|---|
|  | ජාලයේ එම මොහොතේ සංඥා ප්‍රබලත්වය පෙන්වයි. වැඩි තීරු ගණනකින් වැඩි සංඥා ප්‍රබලත්වයක් දැක්වේ. |
|  | බැටරි තත්වය. වැඩි තීරු ගණනකින් වැඩි බැටරි බලයක් පෙන්වයි. |
|  | නොකියවූ කෙටි පණිවිඩ |
|  | එලාම් තබා ඇත. |
|  | බ්ලූටූත් සක්‍රීයව ඇත. |
|  | දුරකථනය නිහඬ අවස්ථාවට සකස් කර ඇත. |
|  | දුරකථනය රැස්වීම් අවස්ථාවට සකස් කර ඇත. |
|  | දුරකථනය එළිමහන් අවස්ථාවට සකස් කර ඇත. |
|  | හෙඩ්සෙට් සම්බන්ධ කර ඇත. |
|  | රෝමින් ක්‍රියාකාරීත්වය |

## ඔබගේ ජංගම දුරකථනය සූදානම් කිරීම

ඔබගේ ජංගම දුරකථනය පළමු වරට භාවිත කිරීම සඳහා සූදානම් කරන්න.

---

### සිම්පත සහ බැටරිය ඇතුල් කිරීම

ඔබ සෙලියුලර් දුරකථන සේවාවක ග්‍රාහකත්වය ලැබූ පසු, ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් අංකය (PIN) සහ විකල්ප සේවා වැනි ග්‍රාහක විස්තර සමග ඔබට ග්‍රාහක හඳුනාගැනීම් මොඩියුල පතක් හෙවත් සිම්පතක් ලැබෙනු ඇත.

සිම්පත සහ බැටරිය ඇතුල් කිරීම සඳහා,

1. බැටරි ආවරණය ඉවත් කරන්න.

(2.1 බලන්න –3 පිටුව)

2. සිම්පත ඇතුල් කරන්න.

ඔබට සිම්පත් 2ක් භාවිත කිරීමට සහ ඒවා මාරුවෙන් මාරුවට භාවිත කිරීමට හැකිවනු පිණිස ඔබගේ දුරකථනයේ සිම්පත් ඇතුල් කළ හැකි ස්ථාන 2ක් ඇත.

( 2.2 බලන්න –3 පිටුව)

- රන් පැහැති සම්බන්ධක යටි පැත්තට සිටින සේ සිම්පත දුරකථනයට ඇතුල් කරන්න.
- සිම්පතක් ඇතුල් නොකර ඔබට ඔබගේ දුරකථනයේ ජාලමය නොවන සේවා සහ සමහර මෙනු භාවිත කල හැකිය.

3. බැටරිය ඇතුල් කරන්න.

(2.3 බලන්න –3 පිටුව)

4. බැටරි ආවරණය නැවත සවි කරන්න.

**මතක පතක් ඇතුල් කිරීම (අවශ්‍යනම් පමණක්)**

අමතර මල්ටිමීඩියා ගොනු ගබඩා කිරීමට අවශ්‍යනම්, ඔබ මතක පතක් ඇතුල් කළ යුතුය.

- මතක පත පරිගණකයකින් ෆෝමැට් කිරීමෙන් එය දුරකථනය හා සංගත නොවන තත්වයක් ඇතිවිය හැකිය. මෙමරි පත දුරකථනය මගින්ම ෆෝමැට් කළ යුතුය.

1. බැටරි ආවරණය ඉවත් කරන්න.

(3.1 බලන්න –4 පිටුව)

2. ලේබලය ඇති පැත්ත උඩට සිටින සේ මතක රඳවනය (Memory Holder) ඇතුල් කරන්න.

(3.2 බලන්න –4 පිටුව)

## මූලික කාර්යයන් සිදු කිරීම

ඔබගේ ජංගම දුරකථනයේ මූලික ක්‍රියාකාරීත්වය ගැන දැන ගන්න.

---

### ඔබගේ දුරකථනය ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියා විරහිත කිරීම

ඔබගේ දුරකථනය ක්‍රියාත්මක කිරීම සඳහා,

1. බල සැපයුම් (Power) බොත්තම [ ] වැඩි වෙලාවක් ඔබාගෙන සිටින්න.

2. ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් අංකය (PIN) ටයිප් කර OK බොත්තම ඔබන්න (අවශ්‍ය නම්).

ඔබගේ දුරකථනය ක්‍රියා විරහිත කිරීම සඳහා, ඉහත 1 වන පියවර අනුගමනය කරන්න.

### මෙනු සහ යෙදුම්වලට ප්‍රවේශය

මෙනු සහ යෙදුම්වලට ප්‍රවේශ වීම සඳහා,

ඔබගේ දුරකථනයේ මෙනුවලට ප්‍රවේශ වීම සඳහා,

1. දුරකථනය නිද්‍රා අවස්ථාවේ පවතින විට, මෙනු සඳහා ප්‍රවේශ වීමට වම් පස මෘදු යතුර < Menu > ඔබන්න.

2. මෙනුවකට හෝ විකල්පයකට යාම සඳහා මං සෙවුම් යතුර භාවිත කරන්න.

3. ඉස්මතු කර පෙන්වන විකල්පය තහවුරු කිරීම පිණිස <Select> විධානය, <OK> විධානය, හෝ තහවුරු කිරීමේ යතුර (Confirm key) ඔබන්න.

4. එක් අදියරක් ඉහළට යාම සඳහා <Back> විධානය ඔබන්න, නිද්‍රා අවස්ථාවට ආපසු යෑම සඳහා [  ] සලකුණ ඔබන්න.

**මූලික ඇමතුම් කාර්යයන් භාවිත කිරීම**

ඇමතුම් ලබා ගැනීම සහ ඇමතුම් සඳහා පිළිතුරු දීම පිළිබඳව දැන ගන්න.

**ඇමතුමක් ලබා ගැනීම:**

1. නිද්‍රා අවස්ථාවේදී, ප්‍රාදේශීය අංකය සහ දුරකථන අංකය ඇතුළත් කරන්න.
2. දුරකථන අංකය ඇමතීම සඳහා [  ] සලකුණ ඔබන්න.

3. ඇමතුම අවසන් කිරීම සඳහා, [  ] සලකුණ ඔබන්න.

**ඇමතුම සඳහා පිළිතුරු දීම:**

1. ඇමතුමක් එනවිට, [  ] සලකුණ ඔබන්න.

2. ඇමතුම අවසන් කිරීම සඳහා, [  ] සලකුණ ඔබන්න.

**පණිවිඩ යැවීම සහ පණිවිඩ බලා ගැනීම**

මෙම කොටසින්, පණිවිඩ (SMS) යැවීම සහ පණිවිඩ (SMS) බලා ගැනීම පිළිබඳව දැන ගන්න:

**පණිවිඩ පාඨයක් යැවීම:**

1. මෙනු අවස්ථාවේදී, Messaging → Write message → Text message තෝරා ගන්න.

2. පණිවිඩ පාඨය ඇතුළත් කරන්න.

3. < Options> විධානය → Send to විධානය ඔබන්න.

4. යවන්නාගේ අංකය ඇතුළත් කරන්න, නැතිනම් සබඳතා ලැයිස්තුවෙන් (Phonebook) තෝරා ගන්න.

5. පූර්ව පියවරට ගැලපෙන සේ <OK> විධානය හෝ Add විධානය ඔබන්න.

6. <Options> විධානය → Send විධානය ඔබන්න.

**සබඳතා ලැයිස්තුවට එකතු කර ගැනීම්**

සබඳතා ලැයිස්තු අංගය (Phonebook) භාවිත කිරීම පිළිබඳ මූලිකාංග දැන ගන්න.

**සබඳතා ලැයිස්තුවට නව සබඳතාවක් එක් කිරීම :**

1. මෙනු අංගය තෝරා ගන්න.

2. සබඳතා ලැයිස්තුව (Phonebook) → නව සබඳතාව එක් කරන්න (Add new contact) තෝරා ගන්න.

3. තොරතුරු ගබඩාව (දුරකථනය, සිම්පත1, හෝ සිම්පත2) තෝරා ගන්න.

4. සබඳතා පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න.

5. සබඳතාව මතකයට එක් කිරීම සඳහා <Options > විධානය → Save විධානය ඔබන්න.

**සබඳතාවක් සෙවීම**

1. මෙනු අවස්ථාවේදී, සබඳතා ලැයිස්තුව (Phonebook) තෝරා ගන්න.

2. ඔබට සෙවීමට අවශ්‍ය නමෙහි මුල් අකුරු කිහිපය ඇතුළත් කරන්න.

3. සෙවුම් ලැයිස්තුවෙන් සබඳතාවෙහි නම තෝරා ගන්න.

සබඳතාවක් සොයාගත් පසු, ඔබට එය [ ] සලකුණ එබීමෙන් ඇමතිය හැකිය.

## සංගීතයට සවන් දීම

මියුසික් ප්ලේයර් හෝ FM ගුවන්විදුලි යන්ත්‍රය හරහා සංගීතයට සවන් දෙන අකාරය දැන ගන්න.

### FM ගුවන්විදුලි යන්ත්‍රයට සවන් දීම:

1. සපයා ඇති හෙඩ්සෙට් උපාංගය දුරකථනයේ බහුකාර්ය ජැක්කුවට සම්බන්ධ කරන්න.

2. මෙනු අවස්ථාවේදී, බහු මාධ්‍ය (Multimedia) →FM ගුවන්විදුලිය තෝරා ගන්න.

3. ගුවන්විදුලිය ක්‍රියාත්මක කිරීම සඳහා පහතට යා හැකි මං සෙවුම් (Navigation down) යතුර ඔබන්න.

4. මං සෙවුම් යතුරු භාවිත කරමින් FM ගුවන්විදුලිය පාලනය කරන්න.

**සංගීත ගොනුවලට සවන්දීම:**

සංගීත ගොනු ඔබගේ දුරකථනයේ "My Music" ෆෝල්ඩරයට හෝ මතක පතට මාරු කිරීමෙන් පසු,

1. මෙනු අවස්ථාවේදී, බහු මාධ්‍ය (Multimedia) → Audio Player තෝරා ගන්න.

2. සංගීත කාණ්ඩයක් → සංගීත ගොනුවක් තෝරා ගන්න.

3. මං සෙවුම් යතුරු භාවිත කරමින් යළි වාදනය පාලනය කර ගන්න.

## කැමරාව භාවිත කිරීම

ඡායාරූප ගැනීම සහ ගත් ඡායාරූප බැලීම පිළිබඳ මූලිකාංග දැන ගන්න.

**ඡායාරූප ගැනීම**

1. මෙනු අවස්ථාවේදී, කැමරාව ක්‍රියාත්මක කිරීම සඳහා කැමරා අංගය තෝරා ගන්න.

2. අදාළ වස්තුව වෙත කාච ඉලක්ක කර අවශ්‍ය වෙනස්කම් කර ගන්න.

3. ඡායාරූපයක් ගැනීම සඳහා තහවුරු කිරීම් (Confirm) යතුර ඔබන්න. ඡායාරූපය ස්වයංක්‍රීයව සේව් වනු ඇත.

4. තවත් ඡායාරූපයක් ගැනීම සඳහා < Back> විධානය ඔබන්න (2 වන පියවර).

**ගත් ඡායාරූප බැලීම**

ඡායාරූප ගැලරිය වෙත ක්ෂණිකව ප්‍රවේශ වීම සඳහා වම් මෘදු යතුර ඔබා ඉන්පසු ඡායාරූප (Photos) තෝරා ගන්න.

**කැමරා විකල්ප**

කැමරා විකල්ප කරා ප්‍රවේශවීමෙන් ඔබට පහත සඳහන් විකල්ප පිළිබඳව දැන ගත හැකිය:

**කැමරා සැකසුම්:**

ඔබ ඡායාරූපයක් ගන්නා සෑම අවස්ථාවකදීම ෂටර හඬක් තෝරා ගන්න.

ඡායාරූපයේ ප්‍රභාව අවශ්‍ය පරිදි සකස් කර ගැනීම සඳහා ආලෝක නිරාවරණ අගය වෙනස් කර ගන්න.

අඳුරු සහ ආලෝකවත් කොටස් වෙන්කර ගැනීම සඳහා අසමතාව සකස් කර ගන්න.

ඡායාරූප මත ඇතිවන ප්‍රතිදීප්ත බලපෑම ඉවත් කිරීම සඳහා ප්‍රති මන්දදීප්ත අගය වෙනස් කර ගන්න.

තමාගේම ඡායාරූප ගැනීම සඳහා ප්‍රමාද කාල පාලකය (Delay Timer) වෙනස් කර ගන්න.

ඡායාරූප මාලාවක් ගැනීම සඳහා අඛණ්ඩ ඡායාරූප ගැනීම් ගණන වෙනස් කරන්න.

**ඡායාරූප සැකසුම්:**

ඔබට ඡායාරූපයේ ප්‍රමාණය වෙනස් කළ හැකිය.

ඔබට ඡායාරූපයේ තත්වය අවශ්‍ය ලෙස වෙනස් කර ගත හැකිය.

**ශ්වේත තුලනය:**

පරිසරයට අනුව, වර්ණ ක්‍රමයක් තෝරා ගන්න.

**දර්ශන තත්වය**:

රාත්‍රියට ගැලපෙන තත්වය (අමතර ආලෝකය) තෝරා ගැනීමට ඔබට ඉඩ සලසයි, නැතහොත් උචිතම තත්වය තෝරා ගැනීමට දුරකථනයට ඉඩ සලසයි.

**ඡායාරූප වේශ සැකසුම්:**

ගන්නා ලද ඡායාරූපවලට වර්ණ වේශ එක් කරයි.

**ඡායාරූප ගබඩාව:**

ගන්නා ලද ඡායාරූප ගබඩා කරන ස්ථානය තෝරා ගැනීමට ඔබට ඉඩ සලසයි.

## බ්ලූටූත් උපාංගය භාවිත කිරීම

දත්ත හුවමාරු කර ගැනීම සඳහා අනෙකුත් රැහැන් රහිත උපාංග සමග සම්බන්ධවීමට ඔබගේ දුරකථනය සතු හැකියාව පිළිබඳව දැන ගන්න.

### රැහැන් රහිත බ්ලූටූත් අංගය කියාත්මක කිරීම

1. මෙනු අවස්ථාවේදී, Settings → Connectivity → Bluetooth තෝරා ගන්න.

2. Power විකල්පය තෝරා ගන්න.

3. එය ක්‍රියාත්මක කිරීම සඳහා වම් මෘදු යතුර ඔබන්න.

4. අනෙකුත් උපකරණවලට ඔබගේ දුරකථනය සොයා ගැනීමට ඉඩ දෙනු පිණිස, Visibility කරා අනුචලනය වී එය ක්‍රියාත්මක කරනු පිණිස වම් මෘදු යතුර ඔබන්න.

**බ්ලූටූත් සක්‍රිය කළ අනෙකුත් උපකරණ සොයා ඒවා සමග සම්බන්ධවීම**

1. මෙනු අවස්ථාවේදී, Settings → Connectivity → Bluetooth → My device → Search new device තෝරා ගන්න.

2. උපකරණයක් වෙත අනුචලනය වී < Select> විධානය ඔබන්න.

3. රහැන් රහිත බ්ලූටූත් අංගය සඳහා පුද්ගලික හඳුනා ගැනීම් අංකයක් (PIN) හෝ අනෙක් උපකරණයට බ්ලූටූත් පුද්ගලික හඳුනා ගැනීම් අංකයක් (PIN) ඇත්නම් එය ඇතුළත් කර <OK> විධානය ඔබන්න.

අනෙක් උපකරණයේ හිමිකරු එම අංකයම ඇතුළත් කලවිට හෝ සබඳතාව පිළිගත් විට, උපකරණ සම්බන්ධවීම සම්පූර්ණ වේ.

රහැන් රහිත බ්ලූටූත් අංගය භාවිත කර දත්ත යවන්න.

1. ඔබගේ දුරකථනයේ යෙදුමකින් ඔබට යැවීමට අවශ්‍ය ගොනුව හෝ අයතමය තෝරා ගන්න.

2. Press < Options > → Send → Via Bluetooth → Select ඔබා උපකරණයේ නම තෝරාගෙන ලබන්නා මත දැක්වෙන ගොනුව පිළි ගන්න.

**රහැන් රහිත බ්ලූටූත් අංගය භාවිත කර දත්ත ලබා ගැනීම**

1. රහැන් රහිත බ්ලූටූත් අංගය සඳහා පුද්ගලික හඳුනා ගැනීම් අංකය (PIN) ඇතුළත් කර හෝ පිළිගෙන, (අවශ්‍ය නම්) <OK> විධානය ඔබන්න.

2. (අවශ්‍ය නම්) උපකරණයෙන් දත්ත ලබා ගැනීමට ඔබ කැමති බව තහවුරු කිරීම පිණිස <Yes> විධානය ඔබන්න.

### බ්ලූටූත් උපකරණයේ නම වෙනස් කිරීම

1. මෙනු අවස්ථාවේදී, select Settings → Connectivity → Bluetooth → My name තෝරා ගන්න.

2. ඔබ කැමති නම ලියා Options → Done ඔබන්න.

### ගබඩා කරන ස්ථානය තෝරා ගැනීම

1. මෙනු අවස්ථාවේදී, Settings → Connectivity → Bluetooth → Advanced → Storage තෝරා ගන්න.

2. ඔබගේ දුරකථනයට මතකපතක් ඇතුළත් කර ඇත්නම්, Memory card තෝරා ගන්න නැතිනම්, දුරකථනය (Phone) තෝරා ගන්න.

# යුරෝපීය අනුකූලතාව (CE)

.වැදගත් වන මෙම කොටස හොඳින් කියවා බලන්න

**ගුවන් විදුලි තරංග**

සෑම ජංගම දුරකථන මාදිළියක්ම වෙළඳපොළට ඉදිරිපත් කිරීමට පෙර අන්තර්ජාතික ප්‍රමිති (ICNIRP) හෝ 2014/53/EU (RED) දරන යුරෝපා සංගම් විධිවිධානයට අනුකූල වන බව තහවුරු කිරීමේ සාක්ෂි අවශ්‍ය වේ. පරිශීලකගේ හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම මෙම ප්‍රමිති හෝ විධිවිධානයේ අනිවාර්ය අවශ්‍යතාවකි.

**මෙම උපකරණය ගුවන් විදුලි තරංගවලට නිරාවරණය වීම පිළිබඳ අන්තර්ජාතික මාර්ගෝපදේශවලට අනුකූලය.**

ඔබගේ ජංගම දුරකථනය ගුවන් විදුලි සම්ප්‍රේෂකයක් සහ ආයකයක් වේ. එය සැලසුම් කර ඇත්තේ අන්තර්ජාතික මාර්ගෝපදේශ මගින් නිර්දේශ කර ඇති ආකාරයට ගුවන් විදුලි තරංගවලට නිරාවරණය වීමේ සීමා (ගුවන් විදුලි සංඛ්‍යාත විද්‍යුත් චුම්භක ක්ෂේත්‍ර) ඉක්මවා නොයන පරිදිය. මාර්ගෝපදේශ ස්වාධීන විද්‍යාත්මක ආයතනයක් (ICNIRP) විසින් සකස් කර ඇති අතර වයස සහ සෞඛ්‍යය කෙලෙස වුවද සැමගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස සැලසුම් කළ ප්‍රමාණවත් සුරක්ෂිතතා ආන්තිකයක් ඒවායෙහි ඇතුළත් වේ.

**යුරෝපා සංගම් නියාමනයට අනුකූලවීම**

මෙමගින්, මෙම උපකරණය 2014/53/EU විධිවිධානයේ අනිවාර්ය අවශ්‍යතාවලට සහ අනෙකුත් අදාළ විධිවිධානවලට අනුකූල වේ.

අනුකූලතා ප්‍රකාශය සඳහා, www.energizeyourdevice.com යන තොරතුරු අඩවියට පිවිසෙන්න.

දැන්වීම: උපකරණය භාවිත කෙරෙන ස්ථානයට අදාළ ජාතික ප්‍රාදේශීයමය විධිවිධාන අනුගමනය කරන්න. මෙම උපකරණය යුරෝපා සංගමයේ සමහර හෝ සියලුම සාමාජික රටවල් තුළ භාවිතය සඳහා සීමා විය හැකිය.

සටහන්:

- භාවිත කර ඇති ප්‍රාවරණ ද්‍රව්‍යය නිසාවෙන් 2.0 හෝ ඊට ඉහළ මාදිළියක USB අතුරු මුහුණතකට පමණක් ජංගම දුරකථනය සම්බන්ධ කල යුතුය. Power USB වශයෙන් හඳුන්වන්න යොදා ගනිමින් සම්බන්ධ කිරීම තහනම් වේ.

- ඇඩප්ටරය උපකරණය අසල ස්ථාපිත කල යුතු අතර එයට පහසුවෙන් ළං වීමට හැකිවිය යුතුයි.

- ජංගම දුරකථනය අධික හෝ අවම උෂ්ණත්වයක් ඇති පරිසරයක භාවිත නොකළ යුතුයි. එය කිසිවිටක දැඩි හිරු එළියට හෝ අධික තෙත් තත්වයකට නිරාවරණය නොවිය යුතුයි. දුරකථනය සහ උපාංග සඳහා යෝග්‍ය උෂ්ණත්වය සෙ. -10˚-55˚ වේ.

- දුරකථනය ආරෝපණය කරන විට සාමාන්‍ය කාමර උෂ්ණත්වය සහ මනා වාතාශ්‍රය ඇති ස්ථානයක තැබිය යුතුයි. සෙ. 5˚-25˚ අතර උෂ්ණත්ව පරාසයක් ඇති ස්ථානයකදී දුරකථනය ආරෝපණය කිරීම නිර්දේශ කෙරේ. නිෂ්පාදක විසින් ලබාදෙන ආරෝපකය පමණක් භාවිත කිරීමට වග බලා ගන්න. අනවසර ආරෝපක භාවිත කිරීමෙන් අනතුරු ඇතිවිය හැකි අතර එමගින් දුරකථනය පිළිබඳ අවසරයද වගකීම් සහතිකයද උල්ලංඝනය වනු ඇත.

**- අනතුරු ඇඟවීම: වැරදි වර්ගයේ බැටරියක් යොදා ගැනීමෙන් දුරකථනය පුපුරා යාමේ අවදානම පවතී. පාවිච්චියෙන් ඉවත් කරන බැටරි උපදෙස්වලට අනුකූලව අපහරණය කරන්න.**

- ඉයර්පෝන සහ හෙඩ්පෝන මගින් නිකුත් වන අධික ශබ්දයේ බලපෑමෙන් ශ්‍රවන හානි ඇති විය හැකිය.

වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා, ඔබට www.energizeyourdevice.com යන තොරතුරු අඩවියට පිවිසිය හැකියි.

විද්‍යුත් චුම්බක ක්ෂේත්‍ර සහ මහජන සෞඛ්‍යය පිළිබඳ වැඩිදුර තොරතුරු පහත සඳහන් තොරතුරු අඩවියෙහි දැක්වේ. http://www.who.int/peh-emf.

ඔබගේ දුරකථනයට සවිවර ඇන්ටනාවක් එක් කර ඇත. එහි ප්‍රශස්ත ක්‍රියාකාරීත්වය උදෙසා, ඔබ එය ඇල්ලීමෙන් හෝ කඩා දැමීමෙන් වළකින්න.

ජංගම උපකරණ කාර්ය පරාසයකින් සමන්විත නිසා ඔබගේ කන හැර වෙනත් ස්ථානවල භාවිත කළ හැකිය. එවැනි අවස්ථාවලදී, හෙඩ්සෙට් හෝ USB දත්ත කේබල සමග භාවිත කරන විට උපකරණය මාර්ගෝපදේශවලට අනුකූල වනු ඇත. ඔබ වෙනත් උපාංගයක් භාවිත කරන්නේනම්, භාවිත කරන නිෂ්පාදනය කුමක් වුවද එය ලෝහවලින් තොර විය යුතු අතර දුරකථනය සිරුරෙන් අවම වශයෙන් සෙ.මී. 1.5 ක් ඈතින් තබන බවට වග බලා ගත යුතුයි.

**Energizer**

CE

**අනුකූලතා සහතිකය**
**ENERGY E10**

**ඇවනීර් ටෙලිකොම්, (208,** බොලෙවාර්ඩ් ඩි ප්ලොම්බියේ, **13581** මාර්සිල් සිඩෙක්ස් **20,** ප්‍රංශය**)** වන අප,
මෙමගින් පහත කරුණු ප්‍රකාශ කර සිටිමු:

එනර්ජයිසර්, නියමයන්හි ඇතුළත් ප්‍රමිති සහ විධිවිධානවලට අනුකූල වේ. 2014/53/EU නියමයේ IV වගන්තියෙහි නිර්වචනය කර ඇති අනුකූලතා සහතික ක්‍රියා පටිපාටිය පහත දැක්වෙන ආයතනයේ පාලනය යටතේ පවතී:

**බේ ඒරියා කම්ප්ලයන්ස් ලැබෝරටරීස් කෝපරේෂන්**
1274 **අන්විල්වුඩ් ඇවනයු, සනිවේල්, කැලිෆෝනියා** 94089. **ඇ.එ.ජ.**
www.baclcorp.com
**දූරකථනය**: +1 408 732 9162   Fax: +1 408 732 9164

උපකරණයේ අනුකූලතා සහතිකය පිළිබඳ සම්පූර්ණ පාඨය තැපෑලෙන් කරන ඉල්ලීමක් මත පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය: **ඇවනීර් ටෙලිකොම්,** 208, බොලෙවාර්ඩ් ඩි ප්ලොම්බියේ, 13581 මාර්සිල් සිඩෙක්ස් 20, ප්‍රංශය.

**2017/09/07**
(දිනය)

**ජෝ ඩැනියල් බර්නීර් / ප්‍රධාන විධායක නිලධාරි**
(බලයලත් නිලධාරියාගේ නම සහ අත්සන)

| මෙම මාදිලිය සඳහා උපරිම විශේෂිත අවශෝෂණ අනුපාතය (SAR) සහ එය වාර්තා කෙරෙන තත්වයන්: | |
|---|---|
| GSM 900 | 0.586 W/kg 10g Head SAR \| 0.731 W/kg 10g Body SAR |
| DCS 1800 | 0.441 W/kg 10g Head SAR \| 0.946 W/kg 10g Body SAR |

භාවිත කරන අවස්ථාවේදී, මෙම උපකරණයට අදාළ සත්‍ය විශේෂිත අවශෝෂණ අනුපාත (SAR) අගයන් සාමාන්‍යයෙන් ඉහත දක්වන ලද අගයන්ට වඩා බෙහෙවින් අඩුය. එයට හේතුව ඇමතුම සඳහා සම්පූර්ණ බලයම අවශ්‍ය නොවන අවස්ථාවේදී පද්ධති කාර්යක්ෂමතාව රැක ගැනීම සහ සබඳතා ජාලය කෙරෙහි මැදිහත්වීම අවම කර ගැනීම පිණිස ඔබගේ ජංගම දූරකථනයේ

මෙහෙයුම් බලය ස්වයංක්‍රීයව අඩුවීමයි. උපකරණයේ බල සැපයුම් ප්‍රතිදානය අඩුවන විට එහි විශේෂිත අවශෝෂණ අනුපාත (SAR) අගයද අඩුවේ.